148

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/02/02/06- i

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.10. 13

අධ්‍යාපන චක්‍රලේඛ අංක - 31/2023

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

<u>නව ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම.</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරණ 2014.10.23 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 8 වගන්තිය මගින් ගුරුවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීම පිළිබඳව දක්වා ඇති අතර, 15 වගන්තිය මගින් අන්තර්කාලීන විධිවිධාන පිළිබඳව සඳහන් කර ඇත.

ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව අවස්ථා ගණනාවක දී මෙම අන්තර්කාලීන විධිවිධාන දීර්ඝ කිරීම සහ අනෙකුත් විධිවිධාන සම්බන්ධයෙන් චක්‍රලේඛ හා උපදෙස් ලිපි නිකුත් කර ඇති නමුත් නිරන්තරයෙන් මේ පිළිබඳව උපදෙස් විමසන බැවින් ඒ සම්බන්ධයෙන් වන පහත කරුණු ඔබගේ කාරුණික අවධානයට යොමු කරමි.

**1. අන්තර්කාලීන විධිවිධාන දීර්ඝ කිරීම.**

1.1. අංක 1885/38 හා 2014.10.23 දිනැති ගුරු සේවා ව්‍යවස්ථාවේ 15වන වගන්තිය මගින් වසර 03ක් ලෙසට සඳහන් වූ අන්තර්කාලීන විධිවිධානයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ප්‍රකාරව මාගේ අංක ED/02/29/02/02/06 හා 2018.04.09 දිනැති ලිපිය මගින් වසර තුන(3) සිට වසර පහ(5) දක්වා දීර්ඝ කරන ලදි.

1.2. එම ලිපියට වැඩිමනත් වශයෙන් නිකුත් කරන ලද අංක ED/02/29/02/02/06 හා 2020.05.18, 2020.12.09 හා 2021.10.22 දිනැති ලිපි මගින් අන්තර්කාලීන විධිවිධාන 2022.10.22 දින දක්වා දීර්ඝ කරන ලදි.

**2. ගුරු සේවයේ උසස්වීම් ලබා දීම.**

2.1. අන්තර්කාලීන විධිවිධානයන් දීර්ඝ කිරීමේ විධිවිධාන ප්‍රකාරව ගුරු සේවයේ උසස්වීම් ලබා දීමේ දී පහත පරිදි කටයුතු කළ යුතු බවට මා විසින් අවසන් වරට නිකුත් කර ඇති අංක ED/02/29/02/02/06(i) හා 2021.11.09 දිනැති ලිපිය මගින් උපදෙස් ලබා දී ඇත.

I. 2019.10.22 දින දක්වා උසස්වීම් දින යෙදෙන ශ්‍රී ලංකා ගුරු සේවයේ සියලුම ගුරුභවතුන්ට සේවා කාලය හා අනෙකුත් අවශ්‍යතාවයන් හැර, වෘත්තීය සමාලෝචනය හා කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් සේ සලකා ගුරු සේවයේ ශ්‍රේණි උසස්වීම් ලබා දීමට ක්‍රියා කළ යුතු ය.

II. 2019.10.23 දින සිට 2022.10.22 දින දක්වා කාලසීමාව තුළ තම උසස්වීම් දින යෙදෙන ගුරුභවතුන්ට ඊළඟ උසස්වීමට පෙර පුහුණුව (මොඩියුල) සම්පූර්ණ කිරීමේ කොන්දේසියකට යටත්ව අදාළ උසස්වීම් ලබා දිය යුතු වේ. එම කොන්දේසියට යටත්ව උසස්වීම් ලබන ගුරුභවතුන් තමා උසස්වීම් ලබන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම මෙන්ම එම උසස්වීම ලැබීමට පෙර සිටි ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම යන කාර්යක්ෂමතා කඩඉම් දෙකම ඊළඟ උසස්වීමට පෙර සම්පූර්ණ කළ යුතු ය.

III. නමුත් 2022.10.22 දින දක්වා කාලසීමාව තුළ I ශ්‍රේණියට උසස්වීම් යෙදෙන ගුරුභවතුන්ට ඉන් ඉහළ ශ්‍රේණි උසස්වීමක් නොමැති බැවින්, එම ගුරුභවතුන් කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

IV. අන්තර්කාලීන විධිවිධාන අවසන් වන 2022.10.22 දිනෙන් පසු උසස්වීම් දින යෙදෙන සියලුම ගුරුභවතුන් ගුරු සේවයේ උසස්වීම් සඳහා සේවා ව්‍යවස්ථාවේ සඳහන් ඊට අදාළ සියලු අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ යුතු ය.

## 3. කාර්යක්ෂමතා කඩඉම් සඳහා ගුරුභවතුන් යොමු කිරීම.

3.1. ගුරු සේවා ව්‍යවස්ථාවේ 15වන වගන්තිය මගින් ප්‍රකාශිත පරිදි මෙම අන්තර්කාලීන විධිවිධාන, ශ්‍රේණි උසස්වීම් ලබා දීමේ කාර්යය සඳහා අදාළ වන බැවින් ඒ සම්බන්ධයෙන් වන උපදෙස් ද උසස්වීම් දින පාදක කරගනිමින් ලබා දීම වඩාත් සුදුසු වන නමුත්, කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීම සම්බන්ධයෙන් මගේ අංක ED/02/29/02/02/06 හා 2018.05.24 හා 2021.05.19 දිනැති ලිපි මගින් ලබා දී ඇති උපදෙස් හි ගුරුභවතුන්ගේ පත්වීම් දිනයන් පාදක කර ගනිමින් උපදෙස් ලබා දීම සිදු කර තිබීම හේතුවෙන් කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කළ යුතු යම් කණ්ඩායම්වලට ඒ සඳහා යොමු වීමට අවස්ථාව නොලද බවට තොරතුරු මා වෙත වාර්තා වී ඇත.

3.2. එම ලිපි නිකුත් කිරීමේ දී, ගුරු සේවා ව්‍යවස්ථාවේ 08වන වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් සමත් විය යුත්තේ අදාළ ශ්‍රේණියට පත් වී කොපමණ වසර ගණනකට පෙර ද යන කාරණාව පමණක් සලකා දින ගණනය කර ඒ අනුව පත්වීම් දිනයන් ප්‍රකාශයට පත් කොට ඇති අතර, ගුරු සේවයේ විවිධ ශ්‍රේණිවලට අදාළව උසස්වීම් දිනයන් වෙනස් වන බැවින් හා එලෙස නිශ්චිත ලෙසට නියමිත කාලසීමා තුළ කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමේ ක්‍රමවේදයක් පද්ධතිය තුළ නොමැති වීම හේතුවෙන් යම් කණ්ඩායමක් වෙත මෙලෙස කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමේ අවස්ථාව මඟ හැරීමක් සිදුව ඇති බව තවදුරටත් නිරීක්ෂණය කරමි.

3.3. කෙසේ නමුත් සියලුම ගුරුභවතුන්ගේ උසස්වීම් ලබා දීමේ කටයුතු උක්ත 02 ඡේදයේ සඳහන් පරිදි සිදු කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

3.4. තව ද, ගුරුවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම(මොඩියුල) සඳහා ගුරුවරුන් සම්බන්ධ කරගැනීම මේ වන විට සිදු කරනු ලබන්නේ ගුරු මධ්‍යස්ථානවලින් වන බැවින්, නියමිත කාල වකවානුවලට අදාළව මොඩියුල සම්පූර්ණ කළ යුතු ගුරුවරුන් හඳුනා ගැනීමේ අපහසුතා ඇති වී තිබෙන බව ගුරු සංවර්ධන මධ්‍යස්ථාන කළමනාකරුවන් විසින් අප වෙත දැනුවත් කර ඇත.

3.5. එබැවින් නියමිත දින වකවානුවලදී කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කළ යුතු ගුරුවරුන්ගේ තොරතුරු, ගුරුවරුන්ගේ පෞද්ගලික ලිපිගොනුවේ කටයුතු සිදු කරනු ලබන කලාප අධ්‍යාපන කාර්යාල විසින් අදාළ ගුරු සංවර්ධන මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

3.6. එමෙන්ම, සතියේ දිනවල පැවැත්වෙන මොඩියුල වැඩසටහන් සඳහා සහභාගී වන ගුරුභවතුන් සඳහා පාසලේ රාජකාරී කටයුතු වලට බාධා නොවන පරිදි රාජකාරී නිවාඩු ලබා දෙන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

## 4. පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කිරීම.

4.1. වසර 03ක සේවා කාලය සම්පූර්ණ කර ඇති නමුත් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව සම්පූර්ණ කළ යුතු කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් සේවයෙහි ස්ථිර කර නොමැති ගුරුවරුන් වෙතින් නිරන්තරයෙන් යොමු වන ඉල්ලීම් සලකා ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් මාගේ සමාංක හා 2022.01.24 දිනැති ලිපියෙන් විමසන ලදි.

4.2. ඊට අදාළව මා වෙත යොමු කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/02-05/03/2020 සහ 2022.04.25 දිනැති ලිපිය අනුව, වසර 03ක සේවා කාලය සම්පූර්ණ කර ඇති නමුත් කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ස්ථිර කර නොමැති ගුරුවරුන් වෙනම කණ්ඩායමක් ලෙස හඳුනාගෙන ඔවුන්ට ප්‍රමුඛත්වය ලබාදී ඉතිරි පුහුණු මොඩියුලයන් කඩිනමින් පැවැත්වීමට කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියෝග කර ඇති බව දන්වා ඇත.

4.3. ඒ පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කර අදාළ පුහුණු වැඩසටහන් කඩිනමින් පැවැත්වීමට හා ස්ථිර කිරීමට ඇති ගුරුභවතුන්ට ප්‍රමුඛතාවය ලබා දී, අවශ්‍ය ඉදිරි කටයුතු නොපමාව සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

5. වෘත්තීය සමාලෝචන ක්‍රියාත්මක කිරීම.

5.1. ගුරු සේවයේ උසස්වීම් සඳහා වන අන්තර්කාලීන විධිවිධාන 2022.10.22න් අවසන්ව ඇති අතර එදිනෙන් පසු ගුරු සේවයේ උසස්වීම් සිදු කිරීම සඳහා උක්ත සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි වෘත්තීය සමාලෝචනය සහ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

5.2. තව ද, ගුරු සේවා ව්‍යවස්ථාවේ 11.2.3. (ඇ) හි ''වෘත්තීය සමාලෝචනය සඳහා යොදා ගනු ලබන වාර්තා සහතික හා සටහන් ආදියට අදාළ වන ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ උපදෙස් ඇතුළු වෘත්තීය සමාලෝචනය පැවැත්විය යුතු ආකාරය පිළිබඳ උපදෙස් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් අවශ්‍ය වන පරිදි විටින් විට නිකුත් කරනු ලබන'' බව ද සඳහන් වේ.

5.3. ඒ අනුව, කෙටුම්පත් කරන ලද වෘත්තීය සමාලෝචන උපදෙස් මාලාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇති අතර, ඒ සඳහා අනුමැතිය ලද පසු එය චක්‍රලේඛයක් ලෙස ඔබ වෙත නිකුත් කිරීමට නියමිත ය.

මෙම චක්‍රලේඛයේ විධිවිධාන සම්බන්ධයෙන් යම් සංශෝධනයක් පවතී නම් ඒ පිළිබඳව ඉදිරියේ දී ඔබ දැනුවත් කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

එම්.එන්. රණසිංහ
ලේකම්

පිටපත් :

| | | | |
|---|---|---|---|
| (1) | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව | - | කරු. දැ.ගැ.ස. |
| (2) | ආයතන අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | - | කරු. දැ.ගැ.ස. |
| (3) | ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), අධ්‍යාපන අමාත්‍යාංශය | - | කරු. අ.ක.ස. |
| (4) | අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු අධ්‍යාපන පරිපාලන), අධ්‍යාපන අමාත්‍යාංශය | - | කරු. අ.ක.ස. |